# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 මැයි මස 15 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.05.15 දින නිකුත් කරන ලදී)


# ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී (ඉවත් කිරීමේ)

**2009 අංක 35 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත ඉවත් කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

ආරක්ෂක අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී (ඉවත් කිරීමේ)

එල්.ඩී. - ඕ 11/2025

# 2009 අංක 35 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත ඉවත් කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය**

1. මේ පනත 2026 අංක        දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2009 අංක 35 දරන පනත ඉවත් කිරීම**

2. 2009 අංක 35 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

**අන්තර්කාලීන විධිවිධාන**

3. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී -

(අ) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී වශයෙන්; සහ

(ආ) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කමිටුවේ සාමාජිකයකු වශයෙන්,

ධුර දරන ලද සෑම තැනැත්තකු ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි එම ධුර දැරීම අවසන් කරනු ලැබිය යුත්තේ ය.

(2) (මෙහි මින් මතු "ඉවත් කරන ලද පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 35 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත ඉවත් කිරීම නොතකා -

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයෙහි සේවය කරනු ලබන සහ -

(i) සන්නද්ධ හමුදාවල සාමාජිකයන් වන සෑම නිලධරයකු ම හෝ සේවානියුක්තයකු ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින

PL 15743 - 465 (2026/04)

සිට බලපැවැත්වෙන පරිදි අදාළ සන්නද්ධ හමුදාවල ඔවුන් අයත් සේවයට අනුයුක්ත කරනු ලැබිය යුතු ය;

(ii) පොලිස් බලකායේ සාමාජිකයන් වන සෑම නිලධරයකු ම හෝ සේවා නියුක්තයකු ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා පොලීසියේ ඔවුන් අයත් සේවයට අනුයුක්ත කරනු ලැබිය යුතු ය;

(iii) සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයන් වන සෑම නිලධරයකු ම හෝ සේවා නියුක්තයකු ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඔවුන් අයත් සේවයට අනුයුක්ත කරනු ලැබිය යුතු ය; සහ

(iv) රාජ්‍ය සේවයේ නියුතු තැනැත්තන් අතරින් සේවයේ යොදවන ලද සිවිල් වැසියන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවයේ ඔවුන්ට අදාළ තනතුරුවලට අනුයුක්ත කරනු ලැබිය යුතු ය;

(ආ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයට අයත් සියලු චංචල සහ නිශ්චල දේපළ, ලේඛන සහ වාර්තා මෙන් ම සියලු වත්කම් සහ වගකීම්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි, ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය වෙත පවරනු ලැබිය යුතු ය;

(ඇ) ඉවත් කරන ලද පනත යටතේ පවරනු ලැබ ඇති සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවත්නා

සියලු නඩු, නඩු පැවරීම් හෝ නීති කෘත්‍ය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි, එම පනත ඉවත් කිරීමක් සිදු නොවූ ලෙස සලකමින්, විභාග කර අවසන් කරනු ලැබිය යුතු ය;

(ඇ) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය විසින් එළඹෙන ලද සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවත්නා සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි, ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් එළඹෙන ලද කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ඉ) ඉවත් කරන ලද පනත යටතේ සාදන ලද සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලපවත්වන ලද සෑම නියෝගයක් ම හෝ රීතියක් ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

**අර්ථ නිරූපණය**

4. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"සන්නද්ධ හමුදා" යන්නෙන්, පිළිවෙලින්, (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනත, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත සහ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනත යටතේ පිහිටුවා ඇති සහ පවත්වාගෙන යනු ලබන යුද්ධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව අදහස් වේ.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.